බාලවයස් ලිංගික අපරාධ සම්බන්ධයෙන් පුවත් වාර්තාවන් මේ දිනවල වඩ වඩාත් දක්නට ලැබෙනා ප්‍රවණතාවයක් නිරීක්ෂණය කළ හැක. කෙසේ නමුත්, එම ඇතැම් පුවත් වාර්තාවන් භාවාතිෂය ලෙසින්, බාලවයස් ලිංගික අපරාධය සැහැල්ලු කොට දක්වන සිරස්තල සමගින් ඉදිරිපත් වී තිබෙනු දැකීම කණගාටුවට කරුණකි.

උදාහරණයක් ලෙසින් පහත පුවත ගත හැක. ලංකාදීප පුවත්පතේ (07/26) "ඔන්ලයින්වලින් පාර කැපී පාසල් සිසුවියක් කාගෙත් සුන්දරියක් වෙලා, පෙම්වතුන් රොත්තේ දෙදෙනෙක් අත්අඩංගුවට" යන සිරස්තලයෙන් යුතුව එම පුවත ඉදිරිපත්ව තිබිණි. අරුණ පුවත්පතේ (07/26) "ඔන්ලයින් පන්තියක් නිසා අතින් අතට ගිය පුංචි කිරිල්ලියක්" යන සිරස්තලය සමගින් එම පුවත දැක්වී තිබිණි. මෙම පුවත් වාර්තා දෙක සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

1) භාවාතිෂය සිරස්තල ඔස්සේ එම අපරාධය ඉදිරිපත් වීම මගින්, එහි බරපතළ කම සැහැල්ලු වී නොතිබෙන්නේද?

2) ලංකාදීප පුවත් වාර්තාවේ බාලවයස් ලිංගික අපරාධයක සැකකරුවන් "පෙම්වතුන්" බවට ලඝු කිරීම ඔස්සේ, නැවතත් එම ලිංගික අපරාධය සැහැල්ලු කොට නොදැක්වෙන්නේද?

3) බාලවයස්කරුවෙකු සිය කැමැත්තෙන් ලිංගික හැසිරීමකට ගියද, එය නීතියෙන් ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක් ලෙස සලකයි. එසේ නම්, වින්දිත බාලවයස්කාරියට වක්‍රාකාරීව දෝෂාරෝපණය එල්ල කෙරෙනා අයුරින් මෙවැනි පුවත් වාර්තාවන් ඉදිරිපත් කරන්නේ මක් නිසාද?

මේ පිළිබඳ ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Aruna**